අනවත්ථිත සූත්‍රය ඇසුරෙන් ධර්ම සාකච්ඡාව
17.11.2019 - ශ්‍රී ලංකාරාමය
නවසීලන්තය

සැම දෙනාටම තෙරුවන් සරණයි!

සැනසිල්ලක් වේවා! මේ වෙලාවේදී අපි දහවල් ආහාර පාන අරගෙන ඉවර උනාට පස්සේ භාවනා වැඩ සටහනේදී කියලා දෙන සූත්‍ර කාණ්ඩය මේ වෙලාවේදී ඉදිරිපත් කරගන්නවා. ඉතින් මේ පින්වතුන්ගේ භාවනාවට විශේෂයෙන්ම හේතු කාරණාවක් වන, විදර්ශනාවට උපකාරවන ධර්ම කැරුණු ටිකක් තමයි මේ වෙලාවේදී කියලා දෙන්නේ. විපස්සනාවට බර කරලා, ධර්ම මනසිකාරයට බර කරලා, ධර්ම මනසිකාරයට උපකාරවන, අද අපි කියලා දෙන ධර්ම කොට්ඨාසය ඉතාම හොඳින් මේ පින්වතුන්ට වැටහේවා! අවබෝධ වේවා! තේරුම් ගන්න ලැබේවා! ඒ සඳහා කිසිම නීවරණ ධර්මයක් බාධකයක් හැටියට ඉදිරිපත් නොවේවා! සිත ශාන්ත කරගෙන මේ ධර්මය අහලා මෙනෙහි කරලා හිතේ ධාරණය කරගෙන ඊට අනුකූලව යෝනිසෝමනසිකාරය යහපත් ලෙස පවත්වලා සැම දෙනාටම දුක්ඛය සමුදය නිරෝධය මාර්ගය කියන චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කරගෙන අමාමහ නිවනින් සැනසෙන්න ලැබේවා කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා.

තව කරුණු කීපයක් තිබෙනවා මම ඒකත් මේ පින්වතුන්ට කියලා දෙනවා මේ වෙලාවේ. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා කරුණු 6 ක් ආනිසංස වශයෙන් සලකාගෙන සියලුම සංස්කාර ධර්මයන් කෙරෙහි අනිත්‍ය හිත පිහිටුවන්න සුදුසු වෙනවා කියලා.

> අනවත්ථිතසුත්තං
>
> ''ඡ, භික්ඛවෙ, ආනිසංසෙ සම්පස්සමානෙන අලමෙව භික්ඛුනා සබ්බසඞ්ඛාරෙසු අනොධිං කරිත්වා අනිච්චසඤ්ඤං උපට්ඨාපෙතුං. කතමෙ ඡ? 'සබ්බසඞ්ඛාරා ච මෙ අනවත්ථිතා. ඛායිස්සන්ති, සබ්බලොකෙ ච මෙ මනො නාභිරමිස්සති, සබ්බලොකා ච මෙ මනො වුට්ඨහිස්සති, නිබ්බානපොණඤ්ච මෙ මානසං භවිස්සති, සංයොජනා ච මෙ පහානං ගච්ඡන්ති, පරමෙන ච සාමඤ්ඤෙන සමන්නාගතො භවිස්සාමී'ති. ඉමෙ ඛො, භික්ඛවෙ, ඡ ආනිසංසෙ සම්පස්සමානෙන අලමෙව භික්ඛුනා සබ්බසඞ්ඛාරෙසුඅනොධිං කරිත්වා අනිච්චසඤ්ඤං උපට්ඨාපෙතු''න්ති.

''ඡ, භික්ඛවෙ, ආනිසංසෙ සම්පස්සමානෙන අලමෙව භික්ඛුනා සබ්බසඞ්ඛාරෙසු අනොධිං කරිත්වා අනිච්චසඤ්ඤං උපට්ඨාපෙතුං = ''මහණෙනි ආනිසංස ධර්ම 6 දැකලා දැනගෙන කොටස් වලට වෙන් කරන්නේ නැතුව සියලු සංස්කාර කෙරෙහි අනිත්‍යය සංඥාව වඩන්න සුදුසුයි''

ආනිසංස 6 ක් තිබෙනවා. මේ ආනිසංස 6 ලැබෙනවා අනිත්‍ය සංඥාව වැඩුවහම. අඩුවක් නැතුව හැම සංස්කාර ධර්මයක් කෙරෙහිම අනිත්‍ය වඩන්න ඕනෑ. සංස්කාර ධර්මයෝ කියලා කියන්නේ හේතුවෙන් හටගෙන තිබෙන දේවල්. ලොකු සංස්කාර, පොඩි සංස්කාර, පේන දේවල්, නොපෙනෙන දේවල්, සියුම් දේවල්, ඕලාරික දේවල් සැම දෙයක්ම හේතුවෙන් හටගෙන තිබෙනවා නම් ඒ සියල්ලම සංස්කාරයි. තවත් විදියකින් හිතනවානම් 'හේතුව' කියන දේ වෙනස් වෙන ජාතියක් නම් 'ඵලයත්' වෙනස් වෙන ජාතියක්. වෙනස්වන වර්ගයේ 'හේතු' වලින් යම්කිසි දෙයක් හැදුනා නම් ඒ ඵලයත් ඒකාන්තයෙන්ම වෙනස් වෙනවා, 'හේතුව' වෙනස්වන නිසා. 'හේතුව' යම්කිසි විදියකින් දුක්ඛ දායක එකක් නම් ඒ දුක්ඛ දායක හේතුවෙන් හැදිච්ච 'ඵලයත්' ඒකාන්තයෙන්ම දුක්ඛ දායකයි. අනාත්මීය වශයෙන් තිබෙන්නා වූ දෙයකින් යම්කිසි දෙයක් හටගත්තා නම් ඒ හට ගත්ත දේත් ඒකාන්තයෙන්ම

අනාත්මයි. වෙනස්වන දේකින් දුක්ඛ දායක දේකින් හැදිච්ච දේ ඒකාන්තයෙන්ම වෙනස් වෙනවාමයි.

මෙන්න මෙහෙම එක අදහසක් තිබෙනවා. මේක ධර්මයට ගැලපෙන්නේ නෑ නමුත් බටහිර මිනිස්සු මේ අදහස ඉදිරිපත් කරලා තිබෙනවා, ඒ මිනිස්සුන්ගේ තාලේට. ඒ තමයි, පුංචි කාලේ ඉඳලාම ළමයින්ට ලෝභය හැදෙනවා. සෙල්ලම්බඩු වලට ආසාවක් හැදෙනවා. ඊළඟට ඇඳුම් පැළඳුම් වලට ආසාවක් හැදෙනවා. තමන්ගේ දේවල් අනිත් අය ගන්නවට අකමැතියි, ඊර්ෂ්‍යාවක් හැදෙනවා. එක පවුලක ළමයි දෙන්නෙක් ඉන්නවානම් අම්මා තාත්තා අනිත් එක්කෙනාට ආදරේ කරනවානම් අනිත් ළමයට අකමැත්තක් ඊර්ෂ්‍යාවක් හැදෙනවා පොඩිකාලේ ඉඳලාම. පුංචි කාලේ ඉඳලාම ළමයින්ට මේවගේ ආසාවල් මේවගේ ඊර්ෂ්‍යාවල් හැදෙන්නේ කුමක් නිසාද කියලා ඒ ගොල්ලන්ගේ හැටියෙන් හිතනවා. ඒ ගොල්ලෝ හිතනවා දෙමව්පියෝ දෙන්නා ලෝභ සහගත නිසා දෙමව්පියෝ දෙන්නා ඊර්ෂ්‍යා සහගත නිසා දෙමව්පියෝ දෙන්නා ඇලීම් සහගත නිසා ඒ ඊර්ෂ්‍යා සහගත දෙමව්පියන්ගෙන් ලෝභ සහගත දෙමව්පියන්ගෙන් හැදෙන දරුවන්ටත් ඒකාන්තයෙන්ම ලෝභය හැදෙනවා, ඊර්ෂ්‍යාව හැදෙනවා, තරහා යනවා කියලා කියනවා. යම්කිසි විදියකින්වත් මේ පුංචි ළමයින්ට ලෝභයක් ඇති නොවෙන්න නම් තණ්හාවක් ඇති නොවෙන්න නම් ඊර්ෂ්‍යාවක් හට නොගන්න නම් ඉස්සරවෙලාම ඒ දෙමව්පියෝ ලෝභය නැති කරන්න ඕනෑ, ද්වේශය නැති කරන්න ඕනෑ කියලා ඒ අය හිතනවා. මේවා නැති කරලා දරුවෙක් හැදුවොත් ඒකාන්තයෙන්ම ඒ දරුවා තරහා යන්නේ නැති ලෝභ කරන්නේ නැති එක්කෙනෙක් බවට පත් වෙනවා කියලා ඒ අයගේ අදහසක් තිබෙනවා. ඇත්තටම එහෙම කරන්න බෑ. කවදාකවත් ඒ අම්මටයි තාත්තටයි ලෝභයක් නැත්නම් ඒ අය ළමයි හදන්න ලෝභ කරන්නේ නෑ. ඒක නිසා එතැනින්ම ඒක නිරාකරණය වෙනවා.

අපිට හිතාගන්න තිබෙන්නේ අනිත්‍ය දේකින් යම්කිසි දෙයක් හැදුනා නම් ඵලයත් ඒකාන්තයෙන්ම අනිත්‍යයයි, වෙනස් වෙනවා. අනිත්‍ය වූ හේතු වලින් හැදිලා තිබෙන මේ අපේ ජීවිතය තමයි ප්‍රතිඵලය, අපේ හිත තමයි ප්‍රතිඵලය. දැන් මේ ප්‍රතිඵලයක් හැටියට තිබෙන ජීවිතය වෙනස් වෙනවා, අපාට වෙනවා, ශක්තිය අඩු වෙනවා, එක විදියකට තියන්න බෑ, ලෙඩ වෙනවා, කකියනවා. අමාරු අපහසුකම් තිබෙනවා. එහෙනම් මේ අමාරු අපහසු කම් වලින් පිරිච්ච කරත්තයක් වගේ මේ ජීවිතය හැදෙන්න හේතු උනෙත් ඒවගේම හයිය නැති කරත්ත වගේ ‘හේතු’. හේතුව යම් ආකාරයිද ඒ හැටියට තමයි ප්‍රතිඵලය හැදෙන්නේ.

ආනිසංස 6 සලකාගෙන හටගත් සියලුම සංස්කාරයන් අනිත්‍යයි, වෙනස්වෙනවා කියලා මෙනෙහි කරන්න සුදුසුයි කියලා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා.

අලමෙව භික්ඛුනා සබ්බසඞ්ඛාරෙසු අනොධිං කරිත්වා අනිච්චසඤ්ඤං උපට්ඨාපෙතුං - මේ සංස්කාරයෝ මෙනෙහි කරනකොට කිසිම තැනක කාණ්ඩ නොකළ යුතුයි කියලා දේශනා කරනවා.

දිව්‍යලෝකයේ සංස්කාර කියලා හෝ මනුස්සලෝකයේ සංස්කාර කියලා ගත්ත ගමන්ම කාණ්ඩ කෙරෙනවා. බ්‍රහ්මලෝකයේ සංස්කාර හොඳයි අපායේ සංස්කාර හොඳ නෑ කියලා කාණ්ඩ කරන්නේ නැතුව, බෙදන්නේ නැතුව, කොටස් කරන්නේ නැතුව සම්පූර්ණයෙන්ම සියලුම සංස්කාරයෝ වෙනස් වෙනවා නැසෙනවා කියලා මෙනෙහි කිරීම සුදුසුයි කියලා දේශනා කරනවා.

රූප වශයෙන් හැදෙන සෑම දෙයක්ම හැදෙන්නේ මේ ආකාස කුහරයේ. පඨවි - ආපෝ - තේජෝ - වායෝ තිබෙන්නේ මේ ආකාස කුහරය ආධාර කරගෙන. මේ පොළොව තලය ඉර හඳ තාරකා අපේ ගෙවල් දොරවල් ඔක්කොම හදාගන්නේ ආකාසයේ. පාරවල් තොටවල් සියල්ලම හැදෙන්නේ ආකාසයේ. අපිට එහාට මෙහාට යාගන්න පුළුවන් කම තිබෙන්නේ, ශරීර කුඩුව එහෙට මෙහෙට

ගෙනියන්න පුළුවන් කම තිබෙන්නේ ආකාසයේ. ඉතින් මේ ආකාස කුහරය ඇතුලේ තමයි මේ කියන්නා වූ ධර්ම ටික රැස්වෙලා තිබෙන්නේ. එතකොට මේ අවකාශයේ තිබෙන හැම දෙයක්ම, හේතුවකින් හට ගත්ත හැම දෙයක්ම වෙනස් වෙවී වෙනස් වෙවී යනවා. නමුත් අහස වෙනස් වෙන්නේ නෑ. අහස හැර අනිත් සියල්ලම වෙනස් වෙනවා, අපාට වෙනවා, දිරනවා, කැඩෙනවා.

තවත් එකක් තමයි, දැන් බලන්න අපේ මේ ශරීර කූඩු වලට අහස උපකාරයි. අපි කිව්වට පොළෝතලය මත අපි ඉන්නවා කියලා එය ශරීරය ගාවලා තියන්න උපකාරක තමයි නමුත් ඊටත් වඩා උපකාරයි අහස. අහසේ කොටසක් පාවිච්චියට අරගන තමයි අපි මේ ඉන්නේ. දැන් මේ අහස කොටස පාවිච්චි කරනවා ශාරීරික වශයෙන්. ශාරීරික වශයෙන් මේ අහස කොටස පාවිච්චියට අරගෙන ඉන්නවා විතරක් නොවෙයි මේ හැම එක්කෙනාගේම හිත් වෙනත් දෙයකට බද්ධ වෙලායි තිබෙන්නේ. වෙනත් දෙයක් අරමුණු කරගෙනයි තිබෙන්නේ. ඇඟ විතරක් තිබෙනවා නොවෙයි. අවකාශය පාවිච්චියට අරගෙන රූප කූඩුව තිබුණාට හිත ඒ අවකාශයේම ළඟ හෝ තවත් තැනක තිබෙන්නා වූ සංස්කාරයකට connection එකක් තියාගෙනයි ඉන්නේ.

මේ විදියට හිතන්න. මේ පින්වතුන්ගේ දරුවෝ දැන් ඉන්නේ ගෙදර. ගෙදර ඉන්න ඒ අය ගෙදර තිබෙන ආකාසයේ කොටසක් පාවිච්චි කරනවා. අවකාශ කොටසක් ඒ ගොල්ලන්ගේ ශරීර වලට ඉඩ හැරලා තිබෙන්නේ. දැන් භාවනා කරන්න ආපු මේ පින්වතුන් ගෙදර ගැන හිතනවා. ඒ ගෙදර ගැන හිතනකොට මේ පින්වතුන් හිතන්නේ ගෙදර තිබෙන අවකාශය නොවෙයි. මේ පින්වතුන් මේ ශාලාවේ මේ තිබෙන අවකාශ කොටස ශරීරයෙන් පාවිච්චියට අරගත්තා වගේම හිත අර තවත් තැනක තිබෙන්නා වූ ඒ අවකාශය පාවිච්චි කරන රූපයකට මෙහෙන් සම්බන්ධයක් හදා ගන්නවා. ඒ විතරක් නොවෙයි ඒ connection එක ඒ රූපයෙන් ඒ ජීවිතයෙන් අයින් කරලා අහකට ගත්ත ගමන් ඒක දානවා office එකට. Office එක කියන්නාවූ ඒ ගොඩනැගිල්ල, ඒ මේසය සියල්ලම තවත් රූප. වෙනත් තැනක අවකාශය පාවිච්චි කරන රූපයෙන් හිත අහකට ගත්තත් ඒක නැවතත් ගිහිල්ලා තව තැනකට සම්බන්ධ කරනවා. එහෙම නැත්නම් මේ පින්වතුන් මේ දෙකෙන්ම හිත අයින් කරලා ආයිත් connect කරනවා ලංකාවේ තිබෙන්නා වූ වස්තුවකට. මේ හරියේ ඉඳගෙන ඉන්නවා විතරක් නොවෙයි මේ ශරීරයෙන් මේ අවකාශ කොටස පාවිච්චියට අරගෙන වෙනත් තැන් වල, ගෙදරද office එකේද වෙන තැනකද තැන් තැන් වල තිබෙන්නා වූ තවත් හේතුවකින් හටගත්ත දේවල් අරමුණු කරගෙනයි ඉන්නේ. හිතින් බද්ධ කරගෙනයි ඉන්නේ.

දැන් ලංකාවේ තිබෙන්නේත් මේ වගේම අහසක් තමයි. ඒකෙ English අහස American අහස Indian අහස Chinese අහස කියලා එහෙම ජාතියක් නෑ. අහස අහසමයි. එහෙ තිබෙන්නා වූ හේතුවකින් හටගත්ත set එකක් මෙතැන අහස පාවිච්චි කරන ගමන් තවත් තැනක අහස පාවිච්චි කරමින් පවතින්නා වූ සංස්කාර ධර්මයකට connection එකක් හදාගෙනයි ඉන්නේ. එක්කෙනෙක් South Island එක ගැන හිතනවා. තව එක්කෙනෙක් North Island එක ගැන හිතනවා. සමහර එක්කෙනෙක් ඇමරිකාව ගැන හිතනවා. එක්කෙනෙක් ලංකාව ගැන හිතනවා. මේ අයගේ මේ කියන්නා වූ හිත එහෙට මෙහෙට සම්බන්ධ වෙලා තිබෙන්නේ.

සමහර සත්තුන්ගේ දිව දිගයි. ඒ දිග දිව තිබෙන සත්වයන්ට පුළුවන් වෙනත් තැනක ඉන්නා වූ සතෙක් ක්‍ෂණයකින් ගන්න. කබරයෝ කටුස්සෝ වගේ සත්තුන්ගේ දිව හරි දිගයි. සර්පයොත් ඒ වගෙයි. එළියේ ඉන්න සතා ඒ දිවේ තැවරිච්ච ගමන්ම මෙහෙට ඇදිලා එනවා. සමහර වෙලාවට තිබෙනවා ඕකේ අනිත් පැත්ත. ඒ තමයි තමන් අහු උනාම ඒ පැත්තට ඇදිලා යනවා.

අපි හිතමු මෙහෙම. ලංකාවේ යම්කිසි දෙයක් තිබෙනවා. මෙහෙ තිබෙන අවකාශය පාවිච්චියට අරගෙන, මේ තිබෙන්නාවූ ඇඟ, මේ හිතෙන් මෙහෙ පවත්වාගෙන තිබෙන්නේ. දැන් මේ හිත

connect කරනවා ලංකාවේ තිබෙන්නා වූ පුංචි කඩ කෑල්ලකට හෝ ගේකට හෝ මොකක් හරි දේකට. නමුත් අර කබරයා වගේ ඒක ඇද්දට ඒක මෙහෙට එන්නේ නෑ. එහෙ තිබෙන ගස්කොළං ටිකයි කරපිංචා ගහයි මල් පැළ ටිකයි ගැලවිලා මෙහෙ එන්නේ නෑ. ඒකට එන්න බෑ. ඒක ස්ථාවර එකක්. නමුත් හිතේ තිබෙන connection එක හරි බලවත් වැඩියි. ඒක නිසා මේ ශරීරය ඇදිලා එතැනට යනවා. සමහර වරණ වස්තු වගේ ඒවා නම් මෙහෙට අරගෙන එන්න පුළුවන්. ඔන්න ඔය විදියට මේ අවකාශය පාවිච්චියට ගන්නවා 'හේතු' වලින් හට ගන්න ඵල ධර්ම.

තව කථාවක් මේකේ කියන්න තිබෙනවා. අපේ ඇඟ හරි පුදුමයි. අපි මේ පොළොවේ අඩිය තිබ්බත් පොළොවේ ඇලෙන්නේ නැතුව යනවා. අපි නැවට මේ ශරීරය හේදිලා දියවෙලා යන්නේ නෑ. අපි පස් ටිකක් අරගෙන වතුරේ දැම්මොත් ඒක දියවෙලා එහෙම්ම පොළොවට සම්බන්ධ වෙලා යනවා. මේ ශරීරයට වතුර දැම්මට එහෙම පොළොවට දිය වෙන්නේ නෑ. ඒ වගේ අමුතු රහසක් අමුතු සංස්කාර ගතියක් මේකේ තිබෙනවා. වතුර දැම්මත් දිය වෙලා හෝදාගෙන පොළොවට සම්බන්ධ නොවෙන්න පවත්වාගෙන යන ධර්ම ස්වභාවයක් මේ ශරීරයේ තිබෙනවා. නමුත් යම්කිසි වෙලාවක අපේ ජීවිතියේ අභ්‍යන්තරයේ තිබෙන්නා වූ යම්කිසි ධර්ම ස්වභාවයක් අයින්වෙලා අහකට ගියහම එදාට මේ ශරීරය මේ පොළොවත් එක්ක බද්ධ වෙනවා. ඒ කියන්නේ එදාට හත්දවසේ දානේ ඒවා මොකක්වත් කරන්න ඕනෑ නෑ කොහේ හරි වැටිච්ච තැනක වතුරේ හරි කැලයක හරි ඒක නිකාම්ම දියාරුවෙලා ඒවගේම පිපිලා ඉදිමිලා පොළොවට බද්ධ වෙලා යනවා. එදාට මේක පොළොවේ කොටසක් බවට පත්වෙලා යනවා. නමුත් දැන් එහෙම වෙන්නේ නෑ. දැන් හැම වෙලේම පස් උඩින් යන්න පුළුවන්. නමුත් පස් එක්ක එහෙම මිශ්‍ර වීමක් වෙන්නේ නෑ. මේ වගේ වෙනස් ගතියක් තිබෙනවා. එක්තරා කාලයක් පොළොව උඩින්ම යනවා නමුත් පොළොවට සම්බන්ධතාවයක් වැඩිය තියා ගන්නේ නෑ. පය ගහන්න සම්බන්ධය තිබෙනවා නමුත් මිශ්‍ර වෙලා යන්නේ නෑ.

යම්කිසි වෙලාවක අපි හිතමු මැරිලා ගියාට පස්සේ මේකට වතුර පාරක් ගහනවා. එහෙම ගැහුවට පස්සේ මේකේ තිබෙන්නාවූ දියාරු ගතිය වතුරත් එක්ක සම්බන්ධ වෙලා වතුරත් එක්ක මිශ්‍ර වෙලා යනවා. නමුත් දැන් එහෙම වෙන්නේ නෑ. ඔන්න ඔය වගේ ස්වභාවයක් තිබෙනවා. දැන් බලන්න, අපි ඔක්කොම ටික පොළොවේම අඩිය තියාගෙන පොළොවට මිශ්‍රවෙන්නේ නැතුව එක තැනක් කේන්ද්‍ර කරගෙන අහස කොටසක් පාවිච්චියට අරගෙන එකතැනක තබාගෙන සිටින මේ ශරීරටික තවත් තැනක තිබෙන සංස්කාරයක් හිතෙන් සම්බන්ධ කරගෙන ඔහොම තිබිලා අපි හිතමු දවසක අපි සියලු දෙනාම නිවන් දැක්කා කියලා. දැන් හිත් නෑ. නිවන් දැක්කට පස්සේ සිත ක්‍රියාත්මක වෙන්නේ නෑ. කොහෙත්ම හිතෙන්නේ නෑ. ලංකාව ගැන හිතෙන්නෙත් නෑ, ඕක්ලන්ඩ් ගැන හිතෙන්නෙත් නෑ, වෙලිංටන් ගැන හිතෙන්නෙත් නෑ, වෙන කිසිම සංස්කාරයක් පිළිබඳ හිතෙන්නෙම නෑ. නිවන් දැක්කහම හිතක් නැති නිසා නින්ද යන්නේ නෑ. හිතක් තිබෙන නිසා තමයි නින්ද යන්නේ. සියලු දෙනාම ඇඟක් සිතක් තිබෙන කම් නිදා ගන්නවා.

නිවන් දැක්කට පස්සේ මේ ශරීර ටික මේ ශාලාවෙන් නැති වෙලා යනවා. ඒවා පොළොවේ කොටසක් බවට පත්වෙනවා. එක්කෝ ගින්දර හරහා පොළොවට මිශ්‍ර වෙනවා. එහෙම නැත්නම් වතුර හරහා පොළොවට මිශ්‍ර වෙනවා. නැත්නම් දිරායෑම නිසා පොළොවට මිශ්‍ර වෙනවා. කොහොම හරි පඨවි ආපෝ තේජෝ වායෝ ටික ඒ ඒ ධර්ම වලට මිශ්‍ර වෙලා මහ පොළොව තලේ කොටස් බවට පත්වෙලා යනවා. එතකොට මේ ශරීර එකක්වත් මේ පරිසරයේ නෑ. එතකොට ඒ ශරීරවලට බද්ධ වෙලා තිබුණ හිත් ටිකට මොකද උනේ? ඒ හිත් ටිකට අපි කියනවා නිවී ගියා, අක්‍රියාත්මක වෙලා ගියා, නොපවතින තත්වයට පත්උනා කියලා.

ආර්ය ධර්මයේ තිබෙනවා මේ නිවී යාමට ලස්සන උදාහරණයක් කියලා. ඒ වගේ දෙයක් තමයි මේ හිතට වෙන්නේ. මේ ශරීරය හැම වෙලාවේම පහන් කණුවක් වගෙයි. පහන් කණුවක් කියන්නත්

පුළුවන් පන්දමක් කියන්නත් පුළුවන්. පහන් කණුව කියලා කියන්නේ, කණුවක් තිබෙනවා උඩින් පහනක් තිබෙනවා. පන්දම කියලා කියන්නෙත් හුළුඅත්තක් වගේ එකක් තිබෙනවා, ඒක උඩින් දැල්වෙනවා. බලාගෙන යනකොට මේ ඇඟ හරියට කණුවක් වගේ. උඩින් හැම වෙලේම පත්තු වෙලා තිබෙන්නේ. අපේ ඇස - කන - නාසය - දිව - ශරීරය කියන ඒවා ලෝකය පැත්තට හරවාගෙන එළියකරගෙන ඒ පැත්තට හැරිලා තිබෙන්නේ. ඇත්තට බැලුවට පස්සේ හුළු අත්තක් වගෙයි මේක. දැන් මේක සම්පූර්ණයෙන්ම නැති වෙලාම ගියහම මේ හරියේ කිසිම හිතක් ක්‍රියාත්මක වෙන්නේ නෑ, හිත ක්‍රියාත්මක වෙන ඇඟකුත් මේ හරියේ නෑ. ඒ උදාහරණයේ තිබෙනවා මෙහෙම - **නිබ්බන්ති ධීරා යථායංපදීපො** කියලා.

යථායංපදීපො = පහනක් නිවී ගියා වගෙයි. පහනක් දැල්වෙනකොට එතැන තෙල් තිබෙනවා තිර තිබෙනවා පහනක් තිබෙනවා. තෙල්, තිර සහ පහන තිබුණත් දැල්වෙන්නේ නැත්නම් ඒකෙන් කරදරයක් නෑ. අපි හිතමු යම්කිසි වෙලාවක ඒ ගිනි සිළුව නිවිලා ගියා. නිවිලා ගියහම කොයි පැත්තටද ගියේ? කොයි පැත්තට ගියාද කියලා දිසාවක් කියන්න බෑ. ආන්න ඒ වගේ යම්කිසි ආකාරයකින් පහනක් නිවී ගියාද ආන්න ඒ වගේ මේ ශරීර ටිකත් නැති වෙලා යනවා. ඒවගේම ඒ ශරීර වලට බද්ධ වෙලා සම්බන්ධ වෙලා දැල්විලා තිබුනා වූ සිත් ටිකත් නිවිලා නැතිවෙලා යනවා. ආයේ ක්‍රියාත්මක වෙන්නේ නෑ.

දැන් මේක මෙහෙම කියනකොට කෙනෙකුට බයක් හිතෙන්න පුළුවන්. 'නිවන් දැක්කට පස්සේ මෙහෙම වෙනවා නම් නිවන් දැක්කේ නැතුවට කමක් නෑ' කියලා කෙනෙකුට හිතෙන්න පුළුවන්. ඇයි එහෙම හිතෙන්නේ? එහෙම හිතෙන්නේ මේ ඇඟේ තිබෙන භයානකත්වය, ඇඟේ තිබෙන දුක්ඛත්වය එයාට තේරෙන්නේ නැති නිසයි. ඇඟට බද්ධ වෙලා තිබෙන සංස්කාර - වේදනාව - සංඥාව වැනි නාම ධර්මවල තිබෙන භයානකත්වය දුක්ඛත්වය එයාට තේරෙන්නේ නැති නිසයි. රූපයෙත් නාමයෙත් තිබෙන භයානකත්වය, ඒ දෙන්නා යුගල වෙලා කරන විපත්තිය දැනෙන්නේ තේරෙන්නේ පෙනෙන්නේ වැටහෙන්නේ නැති හින්දා තමයි එහෙම බය හිතෙන්නේ. ඒ කියන්නේ නිවන් දකිනවාට වඩා මේ දුක හොඳයි කියන එකයි.

මේ වගේ ශරීර කොච්චර නම් අපිට හම්බ වෙලා ඇත්ද. අපිට ලස්සන ශරීර හම්බ වෙලා තිබෙනවා. අපි ඒ කාලේ දිව්‍ය කුමාරවරු දිව්‍යපුත්‍රයෝ වෙලා ආලෝකමත් ශරීර තිබ්බව අය. ඒවගේම සක්විති රජවරුන්ගේ දූවලා පුතාලා වෙලා අතට පයට සේවක සේවිකාවෝ හිටපු අය, නමුත් අද ඒවා එකක්වත් නෑ. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා එක බ්‍රාහ්මණකුට ඔහු එකම නමින් එකම තැන 14 වතාවක් වළලලා තිබෙනවා කියලා. ආන්න ඒ වගේ අපි කොච්චර නම් මේ ශරීර ලබාගෙන විඳවලා ඇත්ද? කොච්චර නම් ශරීර ලබාගෙන අඬලා ඇත්ද? සංයුත්තනිකායේ තිබෙනවා බුදුරජාණන්වහන්සේ මහ පොළොවෙන් පස් ටිකක් අරගෙන භික්ෂූන් වහන්සේලාගෙන් ප්‍රශ්න කරනවා "පොළොවේ පස්ද වැඩි, නියපිට තිබෙන පස්ද" කියලා. මහපොළොවේ තිබෙන පස් අනිවාර්යෙන්ම වැඩියි, ඊටත් වඩා වැඩියි අපි ලබාගෙන තිබෙන ශරීර කියලා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා. ඒවගේම කඳුළු හෙලෙපු ඒවා මහා සාගරයේ ජලයට වඩා වැඩියි කියලා දේශනා කරනවා. ඉතින් ඒවගේ අම්මා තාත්තා මිය ගිය හින්ද, රට රටවල් වල විපත් හින්දා, දූ දරුවෝ නැති වෙච්ච හින්දා. රාජ වද බන්දන වලට ගොදුරු වෙච්ච හින්දා අඬන්න වැළපෙන්න සිදුවූ අවස්ථා වැනි මේ හැම දෙයක්ම නිර්මාණය වෙන්නේ මේ තිබෙන්නා වූ ස්කන්ධ පංචකය නිසා.

අපි හිතමු මේ සියලුදෙනාම නිවන් ගියා කියලා. ශරීර ටිකත් අළුවෙලා දැවිලා ගියා. සිත් ටිකත් නෑ. එහෙමනම් මේ භාවනා වැඩ සටහනත් ඉවර වෙනවා. ඇත්තටම භාවනා වැඩ සටහන ඉවර කරනවා නම්කළ යුත්තේ එහෙම තමයි. **'වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තාය'.**

'වුසිතං බ්‍රහ්මචරියං = 'මම බඹසර පිළිවෙත් වැසුවා
කතං කරණීයං = කරන්න තිබෙන දේ කළා
නාපරං ඉත්ථත්තාය' = මින්පසු තවත් කළයුත්තක් නෑ'

අපි භාවනා වැඩ සටහන් කළෙත් ඒකටයි. ආවෙත් ඒකටයි. බණ ඇහුවෙත් ඒකටයි. ඔක්කෝම ටික කරලා ඉවරයි. ආයේ මට මුකුත් කරන්න දෙයක් නෑ කියලා කියන්න පුළුවන්.

මෙන්න මේ විදියට මේ ආකාස කුහරය ඇතුලේ තිබෙන නාම ධර්මවල - රූප ධර්ම වල තිබෙන අසාරත්වය නිස්සාරත්වය, ඒවා පළුදුවන බව, කැඩෙන බිඳෙන බව හොඳට මෙනෙහි කරන්න. අනිත් එක තමයි මේවා තමන් කියලා හිතාගෙන හිටියට, මම කියලා හිතාගෙන හිටියට මගේ පාලනයට නතු වෙන්නේ නෑ. මේක හොඳට හිතන්න, මම හිතාගෙන ඉන්න විදියට මගේ පාලනයට මේක නතුවෙන්නේ නෑ. මේක මගේ යටතේ පවතින්නේ නෑ. මම හිතන විදියට හිටින්නේ නෑ. ඔන්න ඔහොම එකක් තමයි මේ හැම ශරිරයකම තිබෙන්නේ. ඒ කියන්නේ අනුන්ගේ එකක් වගෙයි. අපිට අයිති නෑ. අපිට අයිති නෑ කියලා කියන්නේ අපේ ශරීරය අපිට control නෑ, අපිට වලංගු නෑ, අපි හිතන විදියට පවතින්නේ නෑ.

මේ විදියට මේ සංස්කාර ධර්මයන් පිළිබඳව හොඳට මෙනෙහි කරන්න. ඒවා කැඩෙන බිඳෙන බව වෙනස් වන බව නිත්‍ය නොවෙන බව හොඳට හිතන්න ඕනෑ, මෙනෙහි කරන්න ඕනෑ කාණ්ඩ කොටස් කරන්නේ නැතුව. මම මේ කියාගෙන ගියේ සංස්කාර range එකයි. බ්‍රහ්ම ලෝකයේ දිව්‍යලෝකයේ මනුස්සලෝකයේ හැම තැනම තිබෙන, හේතුවෙන් හටගත් සියල්ලම කාණ්ඩ කරන්නේ නැතුව කොටස කරන්නේ නැතුව අතීතයේ අනාගතයේ තිබෙන දේවල් එකට අරගෙන මෙනෙහි කරන්න ඕනෑ.

දැන් මෙන්න මේ විදියට ආනිසංස 6 අපි දකින්න ඕනෑ.

1) **'සබ්බසඞ්ඛාරා ච මෙ අනවට්ඨිතතො ඛායිස්සන්ති'** = සියලුම සංස්කාර ධර්මයෝ ඉතිරි නැතුව වෙනස් වෙනවා කියලා සලකන්න ඕනෑ.

දිව්‍යලෝකත් එහෙම බිඳෙනවා බ්‍රහමලෝකෙත් කැඩිලා බිඳිලා යනවා. මනුස්සලොකෙත් එහෙමයි. ජලයෙත් එහෙමයි. මුහුදේ යටත් එහෙමයි. ගොඩත් එහෙමයි. හැම තැනම තිබෙන ජීවිත, මේ සක්වලෙත් පිට සක්වලෙත් අනන්ත සක්වලෙත් හැම තැනම තිබෙන්නා වූ හේතුවකින් හටගත් දෙයක් වේ නම් ඒ සියලුම දේවල් ඒකාන්තයෙන්ම නැති වෙනවා කැඩෙනවා බිඳෙනවා එකක්වත් ඉතුරු නෑ කියන මනසිකාරය තමයි එක ආනිසංසයක්.

2) **සබ්බලොකෙ ච මෙ මනො නාභිරමිස්සති** = අනිත්‍ය සංඥාව වැඩුවහම මගේ හිත ලෝකයේ කිසිම තැනකට නොඇලනවා, නොබැඳෙනවා. සමහර වෙලාවට මේ ලෝකෙට වඩා වෙනත් ලෝකයක් නම් හොඳ ඇති කියලා අපිට හිතෙන්න පුළුවන්. නමුත් අනිත්‍ය සංඥාව වඩුවහම එහෙම වෙන්නේ නෑ. ඒකනිසා මගේ හිත මේ සංස්කාර ධර්මයන් කෙරෙහි නො ඇලේවා කියලා හිත හදාගන්න ඕනෑ.

3) **සබ්බලොකා ච මෙ මනො වුට්ඨහිස්සති** = මගේ හිත මේ කිසිම ලෝකයක රැඳෙන්නේ නැතුව ඇලෙන්නේ නැතුව බැඳෙන්නේ නැතුව මේ සියල්ලගෙන්ම හිත ගැලවිලා නැගිටලා අයින් වෙලා යනවා කියලා ආනිසංසය දැනගෙන සියලු සංස්කාරයන් කෙරෙහි අනිත්‍ය සංඥාව වඩන්න ඕනෑ.

4) නිබ්බානපොණඤ්ච මෙ මානසං භවිස්සති = මගේ හිත නිර්වාණ ධාතුව පැත්තට නැමේවා කියලා ප්‍රාර්ථනාවක් කරමින් ආනිසංසය දැනගෙන සියලු සංස්කාරයන් කෙරෙහි අනිත්‍ය සංඥාව වඩන්න ඕනෑ.

5) සංයොජනා ච මෙ පහානං ගච්ඡන්ති = මගේ හිත මේ සංස්කාරයන්ට, මේ වෙනස්වෙන දේවල් වලට අහුවෙලා තිබෙන බන්ධනය වෙලා තිබෙන සංයෝජන ධර්මයෝ මගේ සිතින් අයින් වෙලා යනවා කියලා ආනිසංසය දැනගෙන සියලු සංස්කාරයන් කෙරෙහි අනිත්‍ය සංඥාව වඩන්න ඕනෑ.

6) පරමෙන ච සාමඤ්ඤෙන සමන්නාගතො භවිස්සාමී'ති = රහත් භාවයෙන් මගේ සිත යුක්ත වෙනවා කියලා ආනිසංසය දැනගෙන සියලු සංස්කාරයන් කෙරෙහි අනිත්‍ය සංඥාව වඩන්න ඕනෑ.

මේ ආනිසංස 6 තිබෙන්නේ ඇත්තටම ප්‍රාර්ථනාවක් හැටියට නොවෙයි, මේක වාක්‍යයක් හැටියට තිබෙන්නේ. මේ ආනිසංස 6 ගැන දැකලා මෙහෙමයි මේක වෙන්නේ කියලා තේරුම් අරගෙන අනිත්‍ය සංඥාව වඩන්න ඕනෑ. අනිත්‍ය සංඥාව දැක්කොත් තමයි මේ ආනිසංස ටික ලැබෙන්නේ.

යම්කිසි දෙයක් කැඩෙනවානම් බිඳෙනවානම් අපේ හිත එතැන ඇලෙන්නේ නෑ. අපි ළඟ තිබෙනවා 'මගේ' කියලා අගයක් දීලා තියාගෙන ඉන්න දේවල්. මගේ කියලා වටිනාකමක් දීලා තියාගෙන ඉන්න කෝප්පය යම්කිසි වෙලාවක අපි දකිනවා බිඳිලා ඉරක් ගිහිල්ල තිබෙනවා. ඊට පස්සේ හිත ඒකෙ ඇලෙන්නේ නෑ. අපි ඒක අයින් කරනවා. නැවත ඒකෙ බැඳෙන්නේ නෑ. ඒක කැඩිච්ච බව දැන ගත්ත නිසා තමයි හිත ඒකෙ නොඇලුනේ. ඒවගේම තමයි අනිත් ඒවටත්.

ඒක බිඳුණ හිත ගැටෙනවා නම් ඒ කියන්නේ අනිත්‍යත්වය හරියට හසු උනේ නෑ කියන එකයි. අනිත්‍යත්වය හිතට හසු උනානම් සිත ගැටෙන්නේ නෑ. ඒ වෙනුවට අලුත් කෝප්පයක් ගත්තොත් ලෝභයක් ඇතිවෙනවා නම් හිත පරෙස්සම් කරගන්න ඕනෑ. හැම වෙලේම පරණ කෝප්පයට සිදු වූ දෙයම අලුත් කොප්පයටත් සිදු වෙන බව හිතා ගන්න ඕනෑ.

දැන් මේ ආනිසංස ටික දැනගෙන දැකගෙන නොඇලී නොබැඳී නොපතා සිටීමට නම් අනිත්‍ය සංඥාව වඩන්න ඕනෑ. අපි යම්කිසි දෙයක් පතනවානම් ඒ පතන්නෙත් සංස්කාරයක්මයි. හේතුවෙන් හටගන්නා දෙයක් පැතුවොත් හැමවෙලාවේම අපිට හමුවෙන්නේ මැරෙන දෙයක්. ශරීරයක් හැටියට හම්බවෙන්නෙත් මැරෙන ශරීරයක්. දරුවෙක් හැටියට හම්බෙවෙන්නෙත් මැරෙන දරුවෙක්. නෝනා කෙනෙක් හරි මහත්තයෙක් හම්බ උනත් ඒත් මැරෙන කෙනෙක්.

ඊළඟට තවත් සූත්‍ර කොටසක් තිබෙනවා. මේ සූත්‍රය මම මීට පෙර කියලා තිබෙනවා. නමුත් මේ පින්වතුන් ඊයේ අහපු ප්‍රශ්නයකට උත්තරයක් හැටියටයි නැවත සිහිපත් කර දීමක් හැටියටයි කියලා දෙන්නේ.

සෝවාන් සකෘදාගාමී අනාගාමී අරිහත් කියලා ආර්යන් වහන්සේලා හතර දෙනෙක් සිටිනවා. පෘථජ්ජනයෝ ඉන්නවා වර්ග දෙකක්. ඒ තමයි අන්ධ පෘථජ්ජනයා සහ කල්‍යාණ පෘථජ්ජනයා. බුදුරජාණන්වහන්සේගේ ධර්මය වැටහෙන්නේ කල්‍යාණ පෘථජ්ජනයාටයි. අන්ධ පෘථජ්ජනයා ඒ ධර්මය ග්‍රහණය කර ගන්න තරම් සුදුසු මානසික තත්වයක නෑ, අන්ධයි. අන්ධ පෘථජ්ජනයා සිතන විදිය ලෝකයට හරි බරයි. ලෝකයෙන් මිදිලා යන්න එයා හිතන්නේ නෑ. කල්‍යාණ මනසක් තිබෙන කල්‍යාණ පෘථජ්ජනයාටයි බුදුරජාණන්වහන්සේගේ ධර්මය හොඳට අහුවෙන්නේ වැටහෙන්නේ තේරෙන්නේ.

එක කාලයක සැරියුත් ස්වාමීන්වහන්සේ සහ මහා කොට්ඨිත ස්වාමීන්වහන්සේ බරණැස් නුවර ඉසිපතනාරාමයේ වැඩ ඉන්නවා. ඒ කාලයේ සැරියුත් ස්වාමීන්වහන්සේ යම්කිසි තැනක වැඩ ඉන්නවා නම් ඒ පළාතේ ඉන්න ස්වාමීන්වහන්සේලා හරි කැමතියි සැරියුත් ස්වාමීන්වහන්සේ මුණ ගැහෙන්න යන්න. ගිහිල්ලා ධර්ම සාකච්ඡාවක් කරන්න. ධර්ම සාකච්ඡාවකට මුල පුරන්න. ධර්ම සාකච්ඡාවකට සම්බන්ධ වෙන්න. සාකච්ඡා කරන දෙයක් අහගෙන ඉන්න හරි කැමතියි ඒ ඥානවන්ත භික්ෂුන් වහන්සේලා. සැරියුත් ස්වාමීන්වහන්සේ කියන්නේ දම් සෙනෙවි. සැරියුත් ස්වාමීන්වහන්සේටත් ධර්ම භාණ්ඩාගාර ගතියක් තිබෙනවා. ධර්ම භාණ්ඩාගාරික ස්වාමීන්වහන්සේ වශයෙන් නම් කරලා තිබෙන්නේ ආනන්ද හාමුදුරුවෝ. බුදුරජාණන් වහන්සේ දේශනා කරපු ධර්මය ආනන්ද හාමුදුරුවන්ගේ සිතේ තමයි තැන්පත් කරගත්තේ.

සැරියුත් ස්වාමීන්වහන්සේට පුළුවන් එක කාරණයක් හරිම ලස්සනට පැති කඩවලට කඩලා හොඳට බලන්න පුළුවන්. ඒවගේ ධර්ම විස්තර කිරීමේ ගතියක් උන්වහන්සේට හොඳට තිබෙනවා. මහා කොට්ඨිත ස්වාමීන්වහන්සේට හිතෙනවා සැරියුත් ස්වාමීන්වහන්සේ ඉසිපතනයේ වැඩ ඉන්න නිසා උන්වහන්සේ බැහැ දකින්න යන්න ඕනෑ, ගිහිල්ලා ධර්ම කාරණයක් දැන ගන්න එක හොඳයි කියලා. මෙහෙම හිතලා මහාකොට්ඨිත ස්වාමීන්වහන්සේ සැරියුත් ස්වාමීන්වහන්සේ ළඟට ගිහිල්ලා වැඳලා පැත්තකින් වැඩ ඉඳගෙන අහනවා **"සීලවතාවුසො, සාරිපුත්ත, භික්ඛුනා කතමෙ ධම්මා යොනිසො මනසිකාතබ්බා"?** = "සාරිපුත්තයන්වහන්ස සිල්වත් භික්ෂුව විසින් යෝනිසෝමනසිකාරය කරන්න හොඳ මොනවාද? කියලා.

ඒ වෙලාවේ සාරිපුත්තයන්වහන්සේ දේශනා කරනවා **'සීලවතාවුසො, කොට්ඨික, භික්ඛුනා පඤ්චුපාදානක්ඛන්ධා අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො සුඤ්ඤතො අනත්තතො යොනිසො මනසි කාතබ්බා** = සිල්වත් භික්ෂුව විසින් පංච උපාදන ස්කන්ධ මෙනෙහි කරන්න ඕනෑ එක්තරා විදියකට කියලා.

යෝනිසෝමනසිකාරය කියලා ධර්මස්වභාවයක් තිබෙනවා. ඒක නුවණින් කරන වැඩක්. ඉතින් ඒ නුවණ යොදන්න තැනක් තිබෙන්න ඕනෑ. ඒ යෝනිසෝමනසිකාරය දාන්න තිබෙන ground එක, base එක තැන තමයි **පංචඋපාදාන ස්කන්ධය.** ඒ තමයි රූප - වේදනා - සංඥා - සංඛාර - විඤ්ඤාණ. නමුත් ඒක මෙනෙහි කරන විදියක් තිබෙනවා. මොකක්ද මේ යෝනිසෝමනසිකාරය කියලා කියන්නේ? යෝනිසෝමනසිකාරය කියලා කියන්නේ නුවණින් මෙනෙහි කරනවා කියන එක.

සිල්වත් භික්ෂුව විසින් පංච උපාදානස්කන්ධය කෙරෙහි යෝනිසෝමනසිකාරය පැවැත්විය යුතුයි.

(සිල්වත් භික්ෂුව)



යෝනිසෝමනසිකාරය

රූප - වේදනා - සංඥා - සංඛාර - විඤ්ඤාණ
(පංච උපාදානස්කන්ධය)

රූපය ගැන යෝනිසෝමනසිකාරය පවත්වන්න ඕනෑ. වේදනාව ගැන යෝනිසෝමනසිකාරය පවත්වන්න ඕනෑ. සංඥාව ගැන සංස්කාරය ගැන විඤ්ඤාණය ගැන යෝනිසෝමනසිකාරය පවත්වන්න ඕනෑ. මේ යෝනිසෝමනසිකාරය පවත්වන විදියක් තිබෙනවා. රූප - වේදනා - සංඥා - සංඛාර - විඤ්ඤාණ කියන පංච උපාදානස්කන්ධය අනිත්‍ය වශයෙන් බලනවා කියන එක

යෝනිසෝමනසිකාරය පැවැත්වීමක්. ඒවා අස්සේ දුකක් තිබෙනවා කියලා බලන එකත් යෝනිසෝමනසිකාරය පැවැත්වීමක්. මේ විදියට බලන ආකාර 11 තිබෙනවා. මෙයින් එක ක්‍රමයකින් බැලුවත් එය යෝනිසෝමනසිකාරය පැවැත්වීමක්.

1) අනිත්‍ය වශයෙන් බලනවා.
2) දුක වශයෙන් බලනවා.
3) රෝගයක් හැටියට බලනවා
4) ගඩුවක් හැටියට බලනවා
5) හුලක් හැටියට බලනවා
6) පීඩාවක් වශයෙන් බලනවා
7) ආබාධයක් වශයෙන් බලනවා
8) අනුන්ගේ දෙයක් වශයෙන් බලනවා
9) විනාශ වෙන දෙයක් වශයෙන් බලනවා
10) හිස් දෙයක් වශයෙන් බලනවා
11) අනාත්ම වශයෙන් බලනවා

මෙතැන තිබෙනවා අනුන්ගේ දෙයක් වශයෙන් බලනවා කියලා එක ආකාරයක්. අනුන්ගේ දේවල් වල තිබෙන ස්වභාවය මොකක්ද? අනුන්ගේ දේවල් ආපහු දෙන්න ඕනෑ. අපි වස් පිංකම් වලට ශාලාවල් hire කරනවා. එතකොට ඒ අනුන්ගේ ශාලාවල් ගත්තහම අපිට ලැබෙන්නේ පැය 3 යි පැය 4, යතුර දෙන්නේ එක වෙලාවකට. යනකොට තිබ්බ‌ව හැටියට හදලා යන්න කියනවා. ඒක නිසා ඔය මොන පිංකම කළත් මොන උත්සවය කළත් අනුන්ගේ නිසා වෙලාවට දීලා බැහැලා යන්න ඕනෑ. ඒවගේ තමයි මේ ස්කන්ධ 5 ත් අපේ අපේ කිය කිය හිටියට මේක දීලා යන්න වෙනවා. ඒකට වෙලාවක් නෑ. ඒක උදේ වෙන්න පුළුවන්, රාත්‍රියේ වෙන්න පුළුවන් දීලා යන්න වෙනවා. ඒක නිසා මේවා අනුන්ගේ දේවල්. අපේ ශරීරය අපේ ශරීරය කියලා තියාගෙන හිටියට මේවා company වාහන වගෙයි. Company වාහන වල අපි අපේ වගේ යනවා. අපි හැම එක්කෙනාටම සොහොනක් තිබෙනවා මේක දාල යන්න. ඒ කියන්නේ මේවා අනුන්ගේ ඒවා. මේක අනුන්ගේ දෙයක් විදියට හිතන එකත් යෝනිසෝමනසිකාරය පැවැත්වීමක්.

අපේ හිත ගැලවිලා යන්නේ නැත්තේ අපිට හරියට sharp වෙලා අනිත්‍ය වැඩෙන්නේ නැති නිසයි. පොඞ්ඩක් දුකයි කියලා තේරෙනවා පීඩාවක් කියලා තේරෙනවා නමුත් හරියට sharp වෙලා bright එකට අනිත්‍ය වැඩුනට පස්සේ තමයි හිත මේවායෙන් අයින් වෙලා යන්නේ.

<u>ප්‍රශ්නය</u> - අනිත්‍ය වෙනවා කියන එකයි වෙනස් වෙනවා එකයි අතරේ වෙනස මොකක්ද?

<u>පිළිතුර</u> - වෙනස් වෙනවා කියන එකත් අනිත්‍ය වෙනවා කියන ඒකේ එක්තරා හැඩ තලයක් තමයි. නිත්‍යය නොවෙන දෙයක් හැටියට බලන්න පුළුවන්, කැඩෙන බිඳෙන දෙයක් හැටියට බලන්න පුළුවන්. පළුදු වෙන දෙයක් හැටියට බලන්න පුළුවන්. මේ වගේ අනිත්‍ය බලන්න පුළුවන් ආකාර ගණනාවකට.

සිල්වත් භික්ෂුව මේ විදියට පංච උපදානස්කන්ධය මෙනෙහි කරනවා. මේ විදියට යෝනිසෝමනසිකාරයෙන් මෙනෙහි කරමින් යනකොට යම්කිසි දවසක ඒ භික්ෂුව සෝවාන් ඵලය සාක්ෂාත් කරනවා = **සොතාපත්තිඵලං සච්ඡිකරෝති**. මේ සිල්වත් භික්ෂුව සෝවාන් ඵලය සාක්ෂාත් කරගන්නේ මාර්ගය වැඩුවහමයි. පංච උපාදානස්කන්ධය ඉහත සඳහන් 11 ආකාරයට මෙනෙහි කිරීමම මේ භික්ෂුවට මාර්ගය වෙනවා. මාර්ගය වඩන්න ground එක වෙන්නේ පංච උපදානස්කන්ධය. මෙසේ මාර්ගය වැඩීමෙන් ඒ සිල්වත් භික්ෂුව සෝවාන් ඵලය සාක්ෂාත් කරනවා.

මාර්ගය

1) අනිත්‍ය වශයෙන් බලනවා.
2) දුක වශයෙන් බලනවා.
3) රෝගයක් හැටියට බලනවා
4) ගඩුවක් හැටියට බලනවා
5) හුලක් හැටියට බලනවා
6) පීඩාවක් හැටියට බලනවා
7) ආබාධයක් හැටියට බලනවා
8) අනුන්ගේ දෙයක් වශයෙන් බලනවා
9) විනාශ වෙන දෙයක් වශයෙන් බලනවා
10) හිස් දෙයක් වශයෙන් බලනවා
11) අනාත්ම වශයෙන් බලනවා

→ **සොතාපත්තිඵලං සච්ඡිකරෝති**
= සෝවාන් **ඵලය** සාක්ෂාත් කරනවා.

බලන්න කොච්චර ලස්සනට ඒ ස්වාමීන්වහන්සේ මේක දේශනා කරලා තිබෙනවාද කියලා. මේක හොඳට මෙනෙහි කරන්න.

විදර්ශනා භාවනාව කරගෙන යනකොට උදයව්‍යය ඥාන අවස්ථාවට පත්වෙනකොට එයා සංස්කාර ධර්මයන්ගේ ඇතිවීම නැතිවීම හොඳට දකිනවා, හොඳට බලනවා. ඒ අවස්ථාවේදී එයාට දිට්ඨි විසුද්ධිය කියලා එකක් හැදෙනවා. දිට්ඨි විසුද්ධිය කියලා කියන්නේ එයා හිතාගෙන හිටපු අඥාන දේවල් ඔක්කොම ඉවත්වෙලා එයාගේ වැරදි දෘෂ්ඨිය සුද්ධ වෙලා යනවා. එහෙම උනහම එයාට කියනවා චූලසොතාපන්න කියලා. ඒ එක තැනක. ඒ කියන්නේ සෝවාන් වෙච්ච කෙනෙකුගේ තිබෙන ගුණ ටික එතැනින් ආරම්භ උනා කියලා. ඒක උපරිමයට වඩාගෙන යනකොට උදයව්‍යය ඥානය - භංග - භය - ආදීනව - පටිසංඛානු ඥානය මෙහෙම ගිහිල්ලා ඊළඟට සංඛාරුපෙක්ඛා ඥානය හරියට යනකොට මෙයාට තිබිච්ච උදයව්‍යය ඥානය තීක්ෂණ වෙලා හොඳට උපේක්ෂාවෙන් යුක්තව එයාට සංස්කාර ධර්මයන්ගේ තිබෙන ස්වභාවය හඳුනාගන්න පුළුවන් ගතියක් ඇතිවෙනවා. ඒ වෙනකොට කිසිම දෙයක් 'මමය' 'මාගේය' කියලා එහෙම බාර ගැනීමක් නෑ. සංස්කාරයන් පමණක් මෙනෙහි කරනවා.

සංස්කාර ධර්මයන් මෙනෙහි කරගෙන යනකොට යම්කිසි අවස්ථාවකදී අනුලෝමික ක්ෂාන්තිය හැදෙනවා. අනුලෝමික ක්ෂාන්තිය කියන්නේ සංඛාරුපෙක්ඛා ඥානයෙනුත් ඉස්සරහට යනකොට හොඳට වැඩිලා තිබෙන යෝනිසෝමනසිකාරය පවත්වන ඒ භාවනායෝගියාගේ සිත මාර්ග ඥානයට සමාන තත්වයකට පත්වෙනවා. මාර්ගයට ගැලපෙන විදියට ඒ භාවනයෝගියාගේ මනසිකාරය පවතිනවා. එතැනට යනකොට තීක්ෂණ විදර්ශනාවක් තිබෙන්නේ. ඒ අවස්ථාවේදී කිසිම දෙයක් ස්ථිර වශයෙන් බාරගන්නේම නෑ. ඒවාගේ කෙනෙකුට දෙන දානයත් හරි මහත් ඵලයි, මහානිසංසයි.

ඒක මෙහෙම තේරුම් ගන්න පුළුවන්. එක තැනක බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා මෛත්‍රී භාවනාව කරන්නා වූ භික්ෂුවට දෙන දානය හරි වටිනවා, ඒක මහත් ඵලයි, මහානිසංසයි කියලා. ඒක නිසා බුදුරජාණන්වහන්සේ භික්ෂූන්වහන්සේලාට මෛත්‍රිය වඩන්න අනුදැන වදාළා. හිතලා බලන්න මෛත්‍රියෙන් කරන්නේ සත්ව සංඥාව දුරුකරන එකද සත්ව සංඥාව තියාගන්න එකද? මෛත්‍රියට සත්ව සංඥාවක් තිබෙන්න ඕනෑ. මේ කියන්නේ සත්ව සංඥාවට ඇලෙනවා කියන කථාව නොවෙයි. සත්ව සංඥාව තිබෙනවා, සත්ව සංඥාවට සුවපත් වේවා කියලා පතනවා. මෛත්‍රී භාවනාව කියන්නේ ඒ විදිය

එකක්. ඒකෙනුත් එහාට ගිය එකක් තමයි විදර්ශනාව කියලා කියන්නේ. මෛත්‍රීභාවනාව කරන කොට එච්චර ආනිසංස සලකනවානම් සත්ව සංඥාව නැති විදර්ශනා භාවනාව වඩනකොට කොච්චර බලයක් ඒකෙ තිබෙනවාද. සෝවාන් උනාට පස්සෙ තවත් වැඩියි. විදර්ශනාව කරනකෙනෙකුට දෙන දානයත් ඒ වගේම මහත් ඵල මහානිසංස වෙනවා.

සෝවාන් වෙනකොට සක්කාය දිට්ඨි - විචිකිච්ඡා - සීලබ්බත පරාමාස කියන කෙලෙස් නැති වෙන්නේ මාර්ග අවස්ථාවේදී. සරලව මෙහෙම හිතන්න. මාර්ග සිතට සහ ඵල සිතට අරමුණු වෙන්නේ මොකක්ද? මාර්ගයට අරමුණු වෙන්නේ නිවන. නිවන අසංඛතයි. ඉස්සෙල්ලාම නිවන ස්පර්ශ කරන සිත තමයි මාර්ග සිත. ඊට පස්සේ ඵල සිත ඇතිවෙනවා. මාර්ගයට අරමුණු වෙන්නෙත් නිර්වාණ ධාතුව. ඵලයට අරමුණු වෙන්නෙත් නිර්වාණ ධාතුව. වෙනස තමයි, මාර්ග අවස්ථාවේදී කෙලෙස් නැසෙනවා, ඵල අවස්ථාවේදී නැසෙන්න දෙයක් නෑ, නැසූ දේ අත්විඳින එකයි තිබෙන්නේ. මාර්ග සිත් වලට කලින් ඇතිවෙන විදර්ශනා ඥාන වලට අරමුණු වෙන්නේ නිවන නොවෙයි. ඒ සිත්වලට අරමුණු වෙන්නේ සංස්කාර ධර්මයෝ. සංස්කාර ධර්මයෝ අරමුණු උනාට ඒ සංස්කාර ධර්මයෝ කිසිම තැනක සත්වයෙක් පුද්ගලයෙක් ජීවයක් ආත්මයක් හැටියට බාර ගන්නේ නෑ. එයා සංස්කාර පමණමයි බලන්නේ.

සිල්වත් භික්ෂූන්වහන්සේ කෙනෙක් මේ කියන්නාවූ ආකාර 11 න් මෙනෙහි කරගෙන මෙනෙහි කරගෙන යනකොට ඒ භික්ෂූන්වහන්සේ සෝවාන් ඵලයට පත්වෙනවා. මෙතැනදී සිල්වත් භික්ෂුව කියලා කිව්වේ පෘථජ්ජන කෙනෙක්.

ඊට පස්සේ මහා කොට්ඨිත ස්වාමීන්වහන්සේ අහනවා "ආයුෂ්මත් ශාරිපුත්‍රයෙනි, සොතාපන්න භික්ෂුව විසින් කවර ධර්මයන් නුවණින් මෙනෙහි කටයුතුද?" කියලා. සාරිපුත්ත ස්වාමීන්වහන්සේ දේශනා කරනවා ඒ භික්ෂුව විසින් මෙනෙහි කළ යුතුව තිබෙන්නේත් මේ පංච උපාදානස්කන්ධය තමයි කියලා. මේ පංච උපාදානස්කන්ධය අනිත්‍ය වශයෙන් දුක්ඛ වශයෙන් අනාත්ම වශයෙන් මෙනෙහි කරගෙන කරගෙන යනකොට ඒ සෝවාන් ආර්යන් වහන්සේ සකෘදාගාමි ඵලය සාක්ෂාත් කරනවා **(සකදාගාමිඵලං සච්ඡිකරෙය්‍ය)**.

ඊට පස්සේ මහාකොට්ඨිත ස්වාමීන්වහන්සේ අහනවා "ආයුෂ්මත් ශාරිපුත්‍රයෙනි, සකෘදාගාමි භික්ෂුව විසින් කවර ධර්මයන් නුවණින් මෙනෙහි කටයුතුද?" කියලා. සාරිපුත්ත ස්වාමීන්වහන්සේ දේශනා කරනවා ඒ භික්ෂුව විසින් මෙනෙහි කළ යුතුව තිබෙන්නේත් මේ පංච උපාදානස්කන්ධයමයි කියලා. එතකොට ඒ සකෘදාගාමී ආර්යන් වහන්සේ අනාගාමී වෙනවා. ඒවගේම අනාගාමී ආර්යන් වහන්සේ පංච උපාදානස්කන්ධය මේ ආකාරයට මෙනෙහි කිරීම නිසා රහතන්වහන්සේ කෙනෙක් බවට පත්වෙනවා. සිල්වන්ත පෘථජ්ජන භික්ෂූන්වහන්සේ, සෝවාන් ආර්යන් වහන්සේ, සකෘදාගාමී ආර්යන් වහන්සේ, අනාගාමී ආර්යන් වහන්සේ යන මේ හතර දෙනා වහන්සේම මේ කියන්නා වූ පංච උපාදානසකන්ධයෝ මේ ආකාරයට මෙනෙහි කරනවා. මෙසේ මෙනෙහි කරනකොට ඒ අයට මේ ඉදිරි ඵල හමුවෙනවා.

ඊළඟට මහාකොට්ඨිත ස්වාමීන්වහන්සේ අහනවා "ආයුෂ්මත් ශාරිපුත්‍රයෙනි, රහත්වූ භික්ෂුව විසින් කවර ධර්මයන් මෙනෙහි කටයුතුද?" කියලා. එතකොට සාරිපුත්ත මහා රහතන්වහන්සේ දේශනා කරනවා රහතන්වහන්සේත් පංච උපාදානස්කන්ධය ඒ ආකරයටම මෙනෙහි කරනවා කියලා. රහතන්වහන්සේට තවත් පත් වීමට ඵලයක් නෑ. සාරිපුත්තයන් වහන්සේ දේශනා කරනවා

නත්ථි, ඛ්වාවුසො, අරහතො උත්තරි කරණීයං කතස්ස වා පතිචයො ; අපි ච ඉමෙ ධම්මා භාවිතා බහුලීකතා දිට්ඨධම්මසුඛවිහාරා චෙව සංවත්තන්ති සතිසම්පජඤ්ඤා චා"ති = රහතන් වහන්සේ විසින්

මතු කළ යුත්තක් නැති බැවින් ආයුෂ අවසන් වෙනතෙක් වැඩ ඉන්න කාලයේදී සිහිය නුවණ පවතාගෙන යැමට මෙසේ මනසිකාරය කරනවා.

සෝවාන් සකෘදාගාමි අනාගාමී අරහත් යන ආර්යන් වහසේලාට මෙනෙහි කරන්න තිබෙන්නේත් ස්කන්ධ පංචකමය තමයි. සිල්වත් පෘථජ්ජන භික්ෂූන්වහන්සේට කරන්න තිබෙන්නේත් ඒකමයි. මේ සූත්‍රයේ පස් දෙනෙක් ගැන කියනවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස කලින් ඔබ වහන්සේ දේශනා කරපු සූත්‍රයකට අනුව මට තේරුණේ සෝවාන් මාර්ගයට පත් වෙච්ච කෙනෙක් සෝවාන් ඵලය නොලබා මිය යන්නේ නෑ කියලා තිබෙනවා වගේ. එතැන තේරුණේ මාර්ගයයි ඵලයයි දුරස්ථ වෙලා වගේ. මාර්ගය ලබලා මිය යන්න ඉස්සෙල්ලා කවදාහරි ඵලය ලබනවා වගේ.

<u>පිළිතුර</u> - ඔව්, ඒකෙ තිබෙන්නේ ධර්මය ස්ථාවර කිරීමක්. ඵලය ස්ථාවරයි කියලා තමයි එතැන කියන්නේ. අපිට මැරෙන්න යන්නේ ක්‍ෂණයයි. මේ වෙලාවේ ඇති වෙච්ච චිත්තක්‍ෂණය ඊළග අවස්ථාවේදී නෑ.

යම්කිසි කෙනෙක් ධර්ම මනසිකාරය කරගෙන යනකොට එයාගේ සිත සෝවාන් වෙන්න අනිවාර්යම නම් ඒ කෙනාගේ සිත සංස්කාර ධර්මයන් මනසිකාරය පවත්වන්න ගොඩ උනානම් කවදාකවත්ම කෙනෙක් ඒ තත්වයට පත්වෙන්නේ නැතුව මිය යන්නේ නෑ. ඒකට කියනවා **'ඨිතකප්පි'** කියලා. ඒ කියන්නේ සෝවාන් ඵලයට ප ත්වෙන්නේ නැතුව මිය යන්නේ නෑ කියනවා.

උදාහරණයක් ලෙස බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා තව මොහොතකින් මේ කල්පය විනාසයට යනවා. ඒ අවස්ථාවේදී එක්කෙනෙක් විදර්ශනා කරනවා. තව මොහොතයි තිබෙන්නේ ලෝකය විනාස වෙන්න නමුත් මේ අවසාන අවස්ථාවේදී එයා සෝවාන් ඵලයට පත්වෙනකම් ලෝකය විනාසවෙන එක සිද්ධ වෙන්නේ නෑ කියලා කියනවා. ධර්මයේ තිබෙන ස්වභාවය - ධර්මයේ තිබෙන හයිය - ධර්මයේ තිබෙන ස්ථාවරත්වය කියලා දෙන්න තමයි එහෙම වචනයක් කියලා තිබෙන්නේ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස සාමාන්‍යයෙන් ඔය විදියට practice කරලා තිබෙන එක්කෙනෙකුට අවසානයේදී මරණ වේදනාව එනකොට ඉස්සෙල්ලා practice කරලා තිබෙන ඒවා ඒ වේදනාවට යටපත් වෙනවා නේද?

<u>පිළිතුර</u> - නෑ. practice කරපු එක්කෙනාට යටපත් වෙන්නේ නෑ. එයාට මොකක් හරි කරගන්න පුළුවන්, නොකරපු එක්කෙනාට අමාරුවෙනවා. ඒක තමයි ආනිසංස. කල් ඇතුව ජීවිතිය අවබෝධ කරගෙන වේදනාවල් පිළිබඳ තේරුම් අරගෙන අවබෝධ කරගෙන ඒවා හොඳට මෙනෙහි කරලා තිබුණා නම් මරණ අවස්ථාවේදී මොන වේදනාව ආවත් එයා මාරාන්තිකව හරි මේක මේ විදියටයි කියලා ඒ වේදනාව මෙනෙහි කරගෙන යනවා. එහෙම නොකර ඉන්න එක්කෙනා තමයි මුලා වෙන්නේ.

ධර්මය මෙනෙහි කරන්නේ නැති එක්කෙනෙකුගේ ජීවිත අවාසනාව ධර්මය පුරුදු කරපු එක්කෙනෙකුට දාන්න හොඳ නෑ. සමහර මිනිස්සු දුක් විඳිනවා සිහිය මුලා වෙනවා, ඒ වෙන්නේ එයා ජීවිතියේ මනසිකාර පැවැත්වීම කරලා නැති හින්දයි. අපේ හාමුදුරුවෝ කෙනෙක් හිටියා. ඒ හාමුදුරුවෝ accident එකක් උනා. අම්මානම් සමාන්‍යයෙන් manageable, තත්තා අඬනවා. හාමුදුරුවන්ගේ කකුල කැඩිලා. ඉතින් හාමුදුරුවෝ හිතනවා මොකක් හරි විපාකයක් දුන්නා, accident එක උනේ නැතත් මොනවා හරි වෙනවා කියලා හාමුදුරුවෝ දොස්තරවරු කියපු විදියට කකුල

තියාගෙන හිටියා. අනිත් අය අඬනවා. කකුල අයිති කාර හාමුරුවෝ එහෙම හිතනවා. බලන්න ඒ ප්‍රතිචාරය.

ස්වාමීන්වහන්ස ඒක මැරෙන්න තරම් දරුණු නෑ නේද?

<u>ස්වාමීන්වහන්සේ</u> - ඒක දරුණුයි, ඒකෙන් හාමුදුරුවෝ අපවත් උනා. පුරුදු කරපු හිත් එහෙම තමයි. සමහර අය හොඳට බලාපොරොත්තුවෙන් ඉන්නවා, 'මට තව ටිකකින් මරණය එන්න පුළුවන්, වේදනාව එන්න පුළුවන් කියලා හිතාගෙන මෙනෙහි කරගෙන ඉන්නවා. මේ වගේ බරපතල වේදනාවක් එනවා කියලා එහෙම දැනෙනවා. මමත් ඇත්තටම මාරාන්තික වේදනා විඳලා තිබෙනවා. ඒ වගේ ඉඳලා ඒක මෙනෙහි කරනවා, තේරුම් ගන්නවා. වටපිටාවේ ඉන්න අයට හරි අමාරුයි. අපිට ඕනෑම මාරාන්තික වේදනාවක් දැන හඳුනා ගන්න පුළුවන් නුවණ වැඩුවහම, මරණය සිද්ධ වෙනවා කියලා දැනගත්තම.

මගේ ශරීරයේ අඟල් 16 කපලා තිබෙන්නේ. ඇතුලෙත් කපලා තිබෙන්නේ. තුවාල දෙකක් තිබෙනවා. එකක් එළියෙ පැත්තේ මසට තිබෙන තුවාලයක්. අනිත් එක ඇතුලේ set එක හාරලා ගත්තු තැනත් තිබෙනවා ලොකු තුවාලයක්. එහෙම කපලා අයින්කරලා පැය පහකටත් වැඩි කාලයක් තිබුණ surgery එක ඉවරවෙලා සිහිය එනකොට තමයි මාරාන්තික වේදනාව දැනෙන්නේ. හේතුව, anaesthetics දෙන්නේ නෑ long-term. විනාඩි 20 ට 20 ට තමයි දෙන්නේ. සිහිය නැතිවෙනකොට හිනහා වේවී සිහිය ගියාට සිහිය එනකොට මහා දුරුණු බලවත්ම වේදනාවක් දැනෙනවා. ඒ වේදනාවේ තදකම නිසා හුස්ම රැල්ල කෙටි වෙනවා. හුස්ම රැල්ල දිගට ගන්න තරම් හයියක් නෑ. ඒ වේදනාව අමතක කරන්න බෑ. ඒ වේදනාව හරි අමුතු බලවත් දැඩි වේදනාවක්. ඒක තවත් වැඩි උනානම් කෙටි හුස්ම වැටීමත් zero වෙලා යනවා.

මට උවමනාවක් තිබුණා බලන්න කොහමද ඒ වේදනාව tolerate කරන්නේ, ඒක දරාගෙන ඉන්නේ කියලා. මම දොස්තරට කීප වතාවක්ම කියලා තිබෙනවා වේදනා නාශක මට අවශ්‍ය උනහම කියන්නම් කියලා. ඉතින් ගොඩක් වෙලා වේදනා විඳලා විඳලා නින්ද යන්නේ නැතිකොට මහන්සියක් හැදෙනවා. ආන්න ඒ මහන්සිය ආවහම දොස්තරට කිව්වහම injection එකක් දෙනවා. ඉතින් ඔන්න ඔය වගේ දේවල් සිද්ධ වෙනවා. ඒක continuously ඇතිවෙච්ච අන්තිම කටුක මාරාන්තික වේදනාවක්, මේක තමයි වේදනාව, මේක තමයි දුක කියන එක තමයි මට එවෙලේ වැටහුනේ.

හොඳයි එහෙනම් සැමදෙනාටම ධර්ම අවබෝධය නිර්වාණ අවබෝධය සුවසේම සිද්ධ වේවා කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා.

සාධු! සාධු ! සාධු !

ඉහත සඳහන් ධර්ම දේශනාව අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.